www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කීර්ති බාලසූරියගේ අභාවයෙන් විසි වසරක්

## පලමු කොටස

## Twenty years since the death of Keerthi Balasuriya

**ඩේවිඩ් නොර්ත් විසිනි**
**2007 දෙසැම්බර් 18**

*කොටස් දෙකකින් යුත් ලිපියක පලමු කොටස මෙහි පලවන අතර දෙවැනි කොටස දෙසැම්බර් 19 වෙනි දින පල වේ.*

අදට යෙදී ඇති කීර්ති බාලසූරියගේ හදිසි හා ඛේදජනක අකල් මරනයේ විසිවෙනි සංවත්සරය, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (හජාජාක) සමරන්නේ ප්‍රගාඪ ගරුත්වයකින් මෙන්ම පාඩුව පිලිබඳ නොනස්නා හැඟීමකින්ද යුතුව ය. වසර ගනනාවකින් පසුව පවා, කීර්ති සහෝදරයා සමග වැඩ කල හා ඔහු දන්නා හඳුනන සියල්ලන්ට ඔහු අහිමිවීමේ පෞද්ගලික හා දේශපාලන පාඩුව තදින්ම දැනේ.

ශ්‍රී ලංකා සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ කාර්යාලයෙහි වැඩ කරමින් සිටියදී 1987 දෙසැම්බර් මස 18 වෙනි දින උදේ ඔහුගේ මරනය සිදු වූයේ කිසිදු පූර්ව සලකුනකින් තොරව ය. ඒ වනවිට ජාත්‍යන්තර කමිටුවේ රැස්වීමකට සහභාගි වී යුරෝපයේ සිට ආපසු පැමින මාසයක් වත් ගතවී තිබුනේ නැත. මාරාන්තික හෘදයාබාධය වැලඳෙන විට ඔහු 1985-86 හජාජාක භේදයේ දේශපාලන පාඩම් පිලිබඳ ප්‍රකාශයක් ලියමින් මේසය අසල වාඩිවී සිටියේය. වයස 39 ක් වූ කීර්ති සහෝදරයා අද ජීවතුන් අතර සිටියේ නම් සැමරීමට බලාපොරොත්තු වනු ඇත්තේ ඔහුගේ 60 වෙනි උපන් දිනයයි.

එහෙත්, ඔහුගේ අකල් මරනයෙන් අපට අහිමිවූ සියල්ල තිබියදීත් ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ අත්‍යාවශ්‍ය පදනමක් බවට පත්වන්නාවූ දේශපාලන වැඩ කටයුතු පිලිබඳ සැලකිය යුතු හා කල්පවත්නා උරුමයක් කීර්ති සහෝදරයා ඉතිරි කර තිබේ.

පසුගිය දශක දෙකේ ඉමහත් ආර්ථික හා දේශපාලන වෙනස්කම් මධ්‍යයේ වුවත්, කීර්ති පොරබදමින් සිටි ප්‍රශ්න හා ගැටලු ඔහු ජීවත්ව සිටි කාලයටත් වඩා අදට, නොඅඩු හදිසි භාවයක් හා අදාලභාවයක් ගැබ්කර ගනියි.

උප-මහාද්වීපයේ ජාතික ධනේශ්වරය හා බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදය අතර පිලිකුල් සහගත ගිවිසුම් පදනම් කරගනිමින්, ඉන්දියාව හා ලංකාව (1972 දක්වා ශ්‍රී ලංකාව හැඳින්වූයේ ඒ නමින්ය) නිදහස ලබාගැනීමට වසරකට මදක් වැඩි කාලයකට පසුව, 1948 නොවැම්බර් 4 වෙනි දින කීර්ති උපත ලැබීය. එක් අතකින් ඉන්දීය හා ලාංකේය ජාතික ධනේශ්වරයත්, අනෙක් අතින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයත් අතර විවිධ ක්‍රමවලින් ගිවිසුම් ඇතිකරගත්තේ වී නමුත්, ඊලඟ දශක හය පුරා දිගහැරුනු සියලු දේශපාලනික ඛේදාන්තයන්ට එමගින් වේදිකාව සකස් විය.

මෙම ගිවිසුම් මගින් පෙන්නුම් කලේ ඉන්දියාවේ හා ලංකාවේ ධනේශ්වරය, අව්‍යාජ නිදහසට දැක්වූ ඇල්මට බෙහෙවින් වැඩිමනත් ලෙස සමාජ විප්ලවයට බිය වූ බවයි. ගාන්ධි හා නේරු ආගමික රේඛා ඔස්සේ ඉන්දියාව බෙදීමට එකඟ වූහ. එය ජනතාවගේ සමාජ අපේක්ෂාවන් පාවාදීමක් වූ අතර දශලක්ෂ ගනනකට ඒ වෙනුවෙන් ජීවිතවලින් වන්දි ගෙවීමට සිදුවූ අතර, කලාපය පුරා අධිරාජ්‍යවාදයේ ග්‍රහනය ස්ථාපිත කරමින් උප මහාද්වීපය නිරන්තරයෙන් ඇවිලී ගිය යුද්ධයන්ගේ තෝතැන්නක් බවට පත් කලේය. ලංකාවේ දී, ජාතික ධනේශ්වරය විසින් " නිදහස", දෙමල සුලුතරයට එරෙහිව ක්‍රමානුකූලව වෙනස්කම් කිරීම් සංස්ථාපනය කිරීමටත් අනාගතයේ සිවිල් යුද්ධය සඳහා බීජ වැපිරීමේත් රාමුව ලෙස යොදාගත්හ.

ජාතික ධනේශ්වරය විසින් නිදහස් අරගලය පාවාදීමෙන්, ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියා මාර්ගයක් මත පදනම්වූ මාක්ස්වාදී පක්ෂයක් විසින් නායකත්වය සපයන කම්කරු පන්තිය විසින් බලය අල්ලාගැනීම හරහා පමනක් අධිරාජ්‍ය විරෝධී ප්‍රජාතන්ත්‍රවාදී අරගලයේ ඓතිහාසිකව ප්‍රගතිශීලී කර්තව්‍යයන් සාක්ෂාත් කල හැකි යයි අවධාරනය කල ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලවයේ මූලික පිලිවෙත සනාථ කරනු ලැබුනි.

සැබවින්ම, ඉන්දීය හා ලාංකේය ධනේශ්වරයට විධිමත් ලෙස බලය පවරා දීමෙන් පසු අවධියේ දී, නිදහස ලබා ගත් කොන්දේසි හෙලාදුටු ලංකාවේ ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ නායකයන් නොනවතින විප්ලවයේ මූලධර්මයන්ට බැඳීගත්හ. කෙසේ වුවද එලඹුනු දශකය තුල ට්‍රොට්ස්කිවාදී ලංකා සම සමාජ පක්ෂය (ලසසප) වේගයෙන් දකුනට තල්ලුවී ගියේය.

පාර්ලිමේන්තු ජයග්‍රහන පසුපස යාමේ දී සියලු වර්ගවල අවස්ථාවාදී අනුගතවීම් දිරිගැන්වූ, ජාතික පසුබිමේ පීඩනයන්හි බලපෑම යටතේ වර්ධනය වූ මෙම ක්‍රියාවලිය තුල, ලසසපය පරිහානිගත වීමේ මූලික සාධකය වූයේ හතරවන ජාත්‍යන්තරය ඇතුලත පොදුවේ වැඩී ගිය ප්‍රතිසංස්කරනවාදී ප්‍රවනතාවන්ය. මයිකල් පැබ්ලෝ හා අර්නස්ට් මැන්ඩෙල් විසින් මෙම බලවේගයන් ක්‍රමානුකූලව වසං කරනු ලැබූ අතර ලසසපයේ අවස්ථාවාදී නැඹුරුව දිරිගැන්වීමට නායකත්වය පවා සම්පාදනය කලහ.

තවමත් කම්කරු පන්තිය තුල විශාල අනුගාමිකත්වයක් සහිත වූ ලසසපයේ දිග් ගැස්සුනු දේශපාලන අර්බුදය, බන්ඩාරනායක මැතිනියගේ ධනේශ්වර ආන්ඩුවට ඇතුල්වීමට එය කැමැත්ත පලකිරීමත් සමග 1964 දී, එහි හිනිපෙත්තට ලඟාවිය. මෙය ලංකාවේ මෙන්ම හතරවන ජාත්‍යන්තරයේ ඉතිහාසයේ ද සන්ධිස්ථානයක් සලකුනු කලේය. දෙවැන්න සම්බන්ධයෙන් ගත්කල, ලසසපය ධනේශ්වරය සමග ප්‍රතිගාමී දේශපාලන සභාගයකට ඇතුල්වීම, පැබ්ලෝවාදී ප්‍රතිසංස්කරනවාදයේ ප්‍රතිවිප්ලවවාදී ස්වභාවය හෙලිදරව් කලේය. ලංකාව සම්බන්ධයෙන් ගත්කල සභාගය ගොඩනැගීම, විසිවසරකටත් අඩු කාලයක් තුල නිර්දය සිවිල් යුද්ධයේ පැනනැගීමට තුඩුදුන් ක්‍රියාවලියක් පනගැන්වී ය.

අන් සියල්ලටමත් වඩා කීර්ති බාලසූරියගේ අධ්‍යාපනය මුල්බැස ගත්තේ මෙම අත්දැකීම්වල පාඩම් උකහා ගැනීම තුලය. මෙම ක්‍රියාවලිය තුල ජාත්‍යන්තර කමිටුව ප්‍රධාන ක්‍රියා කලාපය ඉටු කලේය. 1953, හතරවන ජාත්‍යන්තරය තුල පැනනැගි පැබ්ලෝ හා මැන්ඩෙල්ට එරෙහි අරගලයේ නිමැවුමක් ලෙස ගොඩනඟන ලද ජාත්‍යන්තර කමිටුව, ලංකාවේ වර්ධනයන් පිලිබඳව සැලකිලිමත් වූ අතර ලසසපයේ එන්ට එන්ටම අවස්ථාවාදී වූ හැඩගැසීම කෙරෙහි අවධානය යොමු කලේය.

ලසසපය සභාගයට ඇතුල්වීමෙන් පසුව ජෙරී හීලිගේ නායකත්වය යටතේ බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදීන් ලසසපයට එරෙහිව දේශපාලන ප්‍රහාරයක් දියත් කල අතර එය ලංකාව තුල ට්‍රොට්ස්කිවාදී තරුන ශිෂ්‍යයන් අතර ආකර්ශනයක් දිනා ගත්තේය. 1968 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය ගොඩනැගීමට මුල්වූයේ දේශපාලනික පැහැදිලිකම සඳහා වසර ගනනාවක් තිස්සේ කරන ලද වැඩ කටයුතු ය. කීර්ති ප්‍රධාන ලේකම් තනතුරට තෝරා පත්කර ගන්නා ලදී.

විකොස හා කීර්ති සහෝදරයා ප්‍රධාන දේශපාලන පරීක්ෂනයකට ලක් වීමට වැඩි කල් ගතවූයේ නැත. ලසසපයේ දේශපාලන ද්‍රෝහිත්වය කම්කරු පන්ති ව්‍යාපාරය දුබල කලේය. එය ගොවීන් කම්කරුවන්ගෙන් භේද කිරීමට තුඩුදුන් අතර තරුන ශිෂ්‍යයන් හා ගොවි තරුනයන් සැලකිය යුතු කොටසක් අතර මාවෝවාදී බලපෑම වර්ධනය වීමට ද තෝතැන්නක් සැපයී ය. මෙය ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ගොඩනැගීමටත් එහි සීඝ්‍ර වර්ධනයටත් දායක විය.

මෙම සංවිධානය, රුදුරු අධිරාජ්‍ය විරෝධී සටන්කාමීත්වයේ මූර්තියක් ලෙස පෙනී සිටියේය. ජවිපෙ විප්ලවකාරී දෙඩවිලි තුල සැඟවී ඇති අවශ්‍යයෙන් ම සුලු ධනපති හා ප්‍රතිගාමී දේශපාලන ඉදිරි දර්ශනය සොයා හෙලිදරව් කිරීම සඳහා දේශපාලන ධෛර්ය මෙන් ම මාක්ස්වාදී තීක්ෂන භාවය ද අවශ්‍ය විය.

1970 දී කීර්ති *ජනතා විමුක්ති පෙරමුනේ දේශපාලනය හා පන්ති ස්වභාවය* නම් කෘතිය ලියා පල කලේය. එමගින් මෙම සංවිධානයේ සුලු ධනපති හා ප්‍රති මාක්ස්වාදී ස්වභාවය පැහැදිලිව තහවුරු කලේය. එහි නායක විජේවීර, ජවිපෙ බලයට පැමිනි කල කීර්ති එල්ලන බවට තර්ජනය කලේය.

එහෙත් 1971 දී සභාග ආන්ඩුව ජවිපෙට හා ගම්බද තරුනයන් අතර එහි අධාරකරුවන්ට එරෙහිව රුදුරු මර්දන රැල්ලක් දියත් කලේය. ජවිපෙ සමග ඇති සිය අශමනීය මතභේද තිබියදීත් විකොස, ආන්ඩුවේ මර්දනයට එරෙහිව අරගලයක් ගෙන ගියේය. ජවිපෙට පවා විකොස දේශපාලනයේ ප්‍රතිපත්තිමය ස්වභාවය පිලිගැනීමට සිදුවිය. හිරෙන් නිදහස්වූ පසුව වජේවීර, පක්ෂය ගෙනගිය උද්ඝෝෂනය පිලිබඳව සිය කෘතඥතාවය පලකිරීමට පෞද්ගලිකව ම විකොස කාර්යාලයට ගියේය. (එමගින්, 1980 ගනන්වල දී විකොස සාමාජිකයන් ඝාතනය කිරීමෙන් ජවිපෙ වැලැක්වූයේ ද නැත.)

කීර්තිගේ දේශපාලන දෘඪතරභාවය හා පෞරුෂය පෙන්නුම් කල තවත් වැදගත් අවස්ථාවක් වූයේ බ්‍රිතාන්‍යයේ සමාජවාදී කම්කරු සංගමයේ (සකස) ට්‍රොට්ස්කිවාදීන් විසින් බෙංගාලි විමුක්ති ව්‍යාපාරයට සහාය පිනිස බව පෙනීගිය, ඉන්දියානු අගමැති ඉන්දිරා ගාන්ධිගේ නැගෙනහිර පකිස්ථානයට හමුදා යැවීමේ තීරනය පිලිබඳව ගත් ආස්ථානය ගැන ඔහු කල විවේචනය යි. 1971 දෙසැම්බර් 6 වෙනි දින ප්‍රකාශයට පත්කල සකස හි (කම්කරු විප්ලවවාදී පක්ෂයේ පූර්වගාමියා) මයිකල් බන්ඩා විසින් ලියන ලද ප්‍රකාශනයක මෙසේ සඳහන් විය. "ඉන්දියානු ධනේශ්වර ආන්ඩුව බංග්ලාදේශයට මිලිටරි හා ආර්ථික ආධාර යැවීමට ගත් තීරනයට අපි විවේචනාත්මකව සහයෝගය පලකරමු."

විකොස විසින් ගන්නා ලද්දේ සකසට වඩා මුලුමනින් ම වෙනස් වූ ආස්ථානයකි. 1971 දෙසැම්බර් 8 වෙනි දින ප්‍රසිද්ධ කල ප්‍රකාශනයෙන් කියා සිටියේ: "නිර්ධන පන්තියේ විප්ලවවාදී අවශ්‍යතාවන්

නියෝජනය කරන ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරය, මෙම සියලු දේශපාලන ධරාවන්, අරගල හා ගැටුම් පිලිබඳව සිය ආස්ථානය නිර්නය කරගන්නේ සමාජවාදය සඳහා වූ කම්කරු පන්ති අරගලයේ දෘෂ්ටි ආස්ථානයෙනි. එය අවධාරනයෙන් හා එක එල්ලේ ප්‍රකාශ කරන්නේ යුද වැදී සිටින ධනේශ්වරයේ කිසිදු පාර්ශවයකට සහයෝගය දීම කම්කරු පන්තියේ කර්තව්‍ය නොවන බවත්, පන්ති සතුරාගේ කඳවුරේ සෑම හා සියලු ගැටුමක් ම, උප-මහාද්වීපයේ දශ ලක්ෂ සංඛ්‍යාත පීඩිතයන්ගේ සමාජ හා ජාතික අභිලාෂයන් සාක්ෂාත් කලහැකි එක ම මාවත වන සමාජවාදී සමූහාන්ඩු සංගමයක් ගොඩනැගීමේ ඉදිරිදර්ශනය මත බලය අල්ලාගැනීම සඳහා යෙදා ගත යුතු බවත් ය."

අද මෙන් ක්ෂනික සන්නිවේදනයේ පහසුකම් නොමැති තතු තුල, තම ප්‍රකාශනය පලකරන අවස්ථාව වනවිට විකොස සමාජවාදී කම්කරු සංගමයේ ආස්ථානය ගැන දැන සිටියේ නැත. සකප ප්‍රකාශනය කොලඹට ලඟාවීමෙන් පසුව, විකොස සිය ආස්ථානය ජනතාව අතට පත්වීම වහාම අත්හිටවිය යුතු යයි කීර්ති උපදෙස් දුන්නේ ය. ඔහු හජාජාක ලේකම් ක්ලිෆ් ස්ලෝටර්ට ලිව් පරිදි ඔහු එසේ කලේ "ජාත්‍යන්තරය ඇතුලත පැහැදිලිකම අන් සියල්ලටමත් වඩා වැදගත් ය. ජාත්‍යන්තරය ගොඩනැගීමට සටන් වැදීමෙන් තොරව අපට ජාතික ශාඛාවක් ගොඩනැගිය නොහැකි ය." කෙසේ වුවද 1971 දෙසැම්බර් 16 වෙනි දින, සකස සමග විකොසට ඇති මතභේද පැහැදිලි කරමින් ස්ලෝටර් වෙත යැවූ සිය ලිපිය තුල කීර්ති වචන පටලවා නොගත්තේ ය.

"ඉන්දු පකිස්ථානු යුද්ධයට විරුද්ධ නොවී බෙංගාලි ජනතාවගේ ජාතික විමුක්ති අරගලයට සහාය දැක්වීම හා සමාජවාදී පදනම් මත ඉන්දියාව ස්වේච්චාවෙන් ඒකාබද්ධ කිරීම කල නොහැකි ය. ඉන්දියාව හා පකිස්ථානය ඇතුලතින් ම යුද්ධයට විරුද්ධ නොවී, ඉන්දු උප මහාද්වීපය තුල බොහෝ ජාතීන්ගේ ස්වයං නිර්න අයිතිය ආරක්ෂා කල හැකි එක ම ක්‍රමය වන ඒකාබද්ධ සමාජවාදී ඉන්දියාවක් ගැන කථා කිරීම මුලුමනින්ම අභූතයකි."

1972 ජනවාරි 11 වෙනි දින කීර්ති ලංඩනය වෙත තවත් ලිපියක් යැවීය. මෙවර එය ගාන්ධිගේ මැදිහත්වීම කෙරෙහි බන්ඩා දැක්වූ උද්යෝගිමත් සහයෝගයට පිලිතුරකි. බන්ඩාගේ ආස්ථානය වනාහි මීට පෙර පැබ්ලෝවාදීන්ට එරෙහිව හජාජාක විසින් අරක්ෂා කල ට්‍රොට්ස්කිවාදී මූලධර්මයන්ගෙන් පසුබැසීමක් බව ඔහු තහවුරු කලේය.

"යටත් විජිත ජනතාවන්ගේ අරගලය පිලිබඳව මාක්ස්වාදී ව්‍යාපාරය සතු සියලු අතීත අත්දැකීම්, බංග්ලාදේශය පිලිබඳ හජාජාක වේ සාවද්‍ය දේශපාලන ආස්ථානය පිලිබඳ තර්කනය විසින් අත්හැර දැමීම හා අත්හැර දැමීමට තුඩුදිය හැකිව තිබේ. 1961-63 කාල පරිච්චේදයේදී සමාජවාදී කම්කරු පක්ෂය (ඇමෙරිකාවේ) ට එරෙහිව සකස නායකත්වය විසින් අත්කරගත් සියලු ප්‍රතිලාභයන් සංශෝධනය කිරීමේ දිසාවකට දැන් තල්ලු වෙමින් තිබෙන බවට සාධක තිබේ. දෙසැම්බර් 27 වෙනි දින ඔබගේ ලිපිය මාක්ස්වාදයෙන් මුලුමනින් ම කැඩී ගිය දේශපාලන ආස්ථානයක් ආරක්ෂා කිරීමේ උත්සාහයකට වැඩි දෙයක් නො වේ. එය ආරක්ෂා කිරීමට දරන උත්සාහයේ දී ඔබ මාක්ස්වාදය විකෘති කරයි. ඉන් ඔබ ම ව්‍යාකුලත්වයේ ගිලී යන අතර ඔබගේ දේශපාලන බංකොලොත්කම හෙලිදරව් කෙරේ."

පෙර දක්නාවූ කීර්තිගේ ලිපි සමාජවාදී කම්කරු සංගමයේ නායකයන් විසින් ජාත්‍යන්තර කමිටුව තුල බෙදාහැරියේ නැත. හජාජාක වැඩ කටයුතු කෙරෙහි ස්වාධීන හා විවේචනාත්මක ආකල්පයක් ගැනීමට විකොසට පැවති හැකියාව ගැන වැටහීමක් සහිතව සිටි සමාජවාදී කම්කරු සංගමය කීර්ති සහෝදරයා හා ශ්‍රී ලංකාවේ ට්‍රොට්ස්කිවාදීන් හුදෙකලා කිරීමේ උත්සාහයක නිරත විය.

සකස හා පසුව කම්කරු විප්ලවවාදී පක්ෂය වඩ වඩාත් දකුනට තල්ලුවී ගිය අතර විකෙස හුදෙකලා කිරීමේ ව්‍යායාමය ද එන්ට එන්ටම විසකුරු හා නිර්දය විය. 1985 දී ජාත්‍යන්තර කමිටුව හා එහි බ්‍රිතාන්‍ය සංවිධානය ඇතුලත දේශපාලන අර්බුදය පුපුරා යන තෙක් ම ජාත්‍යන්තර ව්‍යාපාරය ඇතුලත මෙම අගනා ලිපි සඳහා ප්‍රේක්ෂකත්වයක් සොයාගැනීමට හැකි වූයේ නැත

## මතු සම්බන්ධයි

.